<u>සමුපකාර සංවර්ධන අරමුදල - 2011</u>

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය ව්‍යාවනය**

මෙම වාර්තාවේ 1.2.5 ජේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

**1.2.1 ගිණුම්කරණ ප්‍රමිති**

මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් ඉදිරිපත් කළ යුතු වුවත්, ඉදිරිපත් කර තිබුණේ අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනයකි.

**1.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශුද්ධ අගය රු.1 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු දැනට භාවිතයේ පවතින මෝටර් වාහන 02 ක් හා ගොඩනැගිල්ලක් ප්‍රත්‍යාගණනය කර වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 ජනවාරි 01 දිනට රු. 22,353,168 ක්වූ හිඟහිටි සමුපකාර සමිති ණය ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 1,307,700 ක් එනම් සියයට 5.85 ක් පමණක් අයවී තිබුණු අතර 2011 දෙසැම්බර් 31 දිනට තව දුරටත් රු, 21,045,468 ක් එනම් සියයට 94.15 ක් අයවිය යුතුව පැවතුණි. කෙසේ වෙතත්, ඉන් රු.21,024,451 ක් එනම් සියයට 99.90 ක් එදිනට අක්‍රිය ණය ලෙස පැවැතියද, මූල්‍ය ප්‍රකාශනවල ඒ සඳහා අවශ්‍ය බොල් ණය ප්‍රතිපාදනයන් සළසා නොතිබුණි.

### 1.2.3 නොසැසඳුනු පාලන ගිණුම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, පාලන ගිණුම්වල දැක්වුණු ශේෂයන් සමඟ ඒවායේ උපලේඛනවල ශේෂයන් නොසැසඳුනු අවස්ථා විය. විස්තර පහත දැක්වේ.

| අයිතමය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | උපලේඛනය අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| සමුපකාර සමිති ණය | 11,560,104 | 32,410,025 | 20,849,921 |
| කෘෂි නිෂ්පාදන අලෙවි සංවර්ධන අරමුදල | 9,482,737 | 12,860,953 | 3,378,216 |
| ලැබිය යුතු සමූපකාර සමිති ණය පොලී | 6,204,534 | 5,605,321 | 599,213 |

### 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වත්කම් ගිණුම් 03 කට අදාල එකතුව රු. 23,715,600 ක් හා බැරකම් ගිණුම් 05 කට අදාල එකතුව රු. 48,466,027 ක් වර්ෂ 03 සිට 06 දක්වා කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල අයවීමකින් හෝ පියවීමකින් තොරව ඉදිරියට ගෙන එමින පැවතුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එමින් පැවති රු.2,411,653 ක් වු අගරු චෙක්පත් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.

**1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

| ගිණුම් විස්තරය | වටිනාකම | විගණනයට ඉදිරිපත් නොවූ ලිඛිත සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) දේපළ,පිරියත හා උපකරණ | 7,478,705 | සමීක්ෂණ වාර්තා, වත්කම් ලේඛන |
| (ආ) සමුපකාර සමිති ණය | 11,560,104 | ශේෂ සනාථ කිරීම්, කාල විශ්ලේෂණ |
| (ඇ) කෘෂි අරමුදල් සමුපකාර සමිති ණය. | 9,482,737 | ශේෂ සනාථ කිරීම්, කාල විශ්ලේෂණ |
| (ඈ) සමූපකාර විදුහල් ණය. | 2,666,000 | ශේෂ සනාථ කිරීම්, කාල විශ්ලේෂණ |
| (ඉ) උතුරු නැගෙනහිර සමූපකාර සමිති වෙත ලබාදුන් ලොරි රථ ණය. | 19,050,000 | ශේෂ සනාථ කිරීම්, කාල විශ්ලේෂණ |
| (ඊ) ඉසුරු සවිය සමුපකාර දින සැමරුම් උළෙල | 159,900,000 | වියදම් විස්තර |

**1.2.6 නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති ,රීති, රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඑඩී 57 දරන චක්‍රලේඛය | | |
| - 4 ජේදය | - | අරමුදලේ මුළු ප්‍රචාරණ වියදම අයවැයගත මුළු මෙහෙයුම් පිරිවැයෙන් සියයට 5 කට වඩා අඩු විය යුතු වුවත්, සංශෝධිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව, අරමුදලේ ප්‍රචාරණ වියදම රු.22,000,000 ක් වූ අතර, එය මුළු මෙහෙයුම් පිරිවැයෙන් සියයට 55 ක් විය. |

| | | |
|---|---|---|
| - 8 වන ඡේදය | 1,939,052 | චක්‍රලේඛය ප්‍රකාරව, වෙළඳ දැන්වීම් සඳහා අවම මිල පහසුකම් ලබා ගැනීමට රාජ්‍ය මාධ්‍ය ආයතන සමඟ ගනුදෙනු කළ යුතු වුවත්, අරමුදල විසින් කෝප් සිටි හා දැයට කිරුළ වැඩසටහන් වෙනුවෙන් සිදු කළ වෙළඳ දැන්වීම් පෞද්ගලික මාධ්‍ය ආයතන දෙකකට ලබා දී ඒ සඳහා එකතුව රු.1,939,052 ක මුදලක් වැය කර තිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | - | අරමුදලේ වත්කම් සම්බන්ධයෙන ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යා යුතු වුවත් එසේ පවත්වා නොතිබුණි. |
| (ඇ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | |
| - 4 .1 (අ) ඡේදය | - | සමාලෝචිත වර්ෂය සඳහා වු අයවැය ලේඛනය නියමිත පරිදි ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත්කර නොතිබුණි. |
| - 4.3 ඡේදය | - | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වු කාර්යසාධන වාර්තාවක් හා සමුච්චිත අරමුදලේ වෙනස්කම් දැක්වෙන ප්‍රකාශයක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිටපතක් සහිතව විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) රජයේ මුදල් රෙගුලාසි | | |
| (i) මු.රෙ 188 (2) | 530,833 | මාස 06 ක කල් ගත වූ එකතුව රු.530,833 ක ලැබීම්වලට අදාල චෙක්පත් 3 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) මු.රෙ 264 | 78,000,000 | එකතුව රු.78,000,000 ක වටිනා වවුචර් සම්බන්ධයෙන් ආදායකයා විසින් මුදල් ලබා ගත් බවට සහතික කෙරෙන කුවිතාන්සි ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) මු.රෙ 371 (2) (ආ) | 3,059,045 | දෙන ලද අතුරු අග්‍රිමයන් අදාල කාර්ය නිම වූ විගසම පියවිය යුතු වූවත්, රු.3,059,045 ක අත්තිකාරම් පියවීමේදී මාස 01 සිට මාස 10 දක්වා කාල පරාසයක ප්‍රමාදයන් සිදුවී තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.156,248,490 ක ඌනතාවයක් වු අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂය සඳහා වු අතිරික්තය රු.19,444,423 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.175,692,913 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඊට ප්‍රධාන වශයෙන් ප්‍රචාරණ හා විකුණුම් වියදම, වෙනත් වියදම් සහ මූල්‍ය වියදම් පිළිවෙලින් රු.160,678,559 කින්ද, රු.10,111,593 කින්ද, රු.3,792,259 කින්ද වැඩිවීම බලපා තිබුණි. කෙසේ නමුදු මෙම වාර්තාවේ 1.2.2. (ආ) ජේදයෙහි රු.21,024,451 ක අඩුවෙන් දැක්වීම් ඌනතාවයට ගලපන ලද්දේ නම් සමාලෝචිත වර්ෂයේ රු.156,248,490 ක් වු ඌනතාවය රු.177,272,941 ක ඌනතාවයක් දක්වා වැඩිවනු ඇත.

### 2.2 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

අරමුදලේ මෙහෙයුම් වියදම් අසාමාන්‍ය ලෙස ඉහළ යාම, ණය අය නොවීම හා මෙහෙයුම් ඌනතාවය හේතුවෙන් සමුච්චිත අරමුදල හීන වීම අරමුදලේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි බලපෑමක් ඇති නොවේය යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පැවැත්වූ "ඉසුරු සවිය" ජාතික සමුපකාර දින සැමරුම් උළෙලේ වියදම් සඳහා අරමුදලින් රු.159,900,000 ක් ජාතික සමුපකාර මණ්ඩලය වෙත ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) එම උළෙලට අදාල අයවැය ඇස්තමේන්තුව, යෝජිත වැඩසටහන් පිළිබඳ විස්තර හා වැය දැරීම් පිළිබඳ විස්තර 2013 සැප්තැම්බර් 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඊට අදාල තොරතුරු දෙපාර්තමේන්තුව සතු නොවන බව සමුපකාර කොමසාරිස් විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ii) එම සැමරුම් උළෙල සඳහා අවශ්‍ය මුදල් සපයා ගැනීමේදී අරමුදල සතු වූ එකතුව රු.102,686,048 ක්වූ ස්ථාවර තැන්පතු ඇපයට තබා රු. 90,000,000 ක බැංකු ණයක් ලබා ගෙන තිබුණි. ඊට අමතරව, සමුපකාර අතිරික්ත අරමුදලින් රු.45,500,000 ක ණය මුදලක්ද ඒ සඳහා ලබා දී තිබූ අතර, ඉන් රු.40,000,000 ක් 2013 සැප්තැම්බර් 30 දින වන විටත් පියවීමට අරමුදල කටයුතු කර නොතිබණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී මෙම වැඩසටහන මඟින් ලැබී තිබුණු ආදායම රු.200,000 ක් වූ අතර, එය ඉහත ණය මුදල් පියවීමට කිසිසෙත් ප්‍රමාණවත් නොවන හෙයින්, ස්ථාවර තැන්පතු ඇප තබා ලබාගත් ණය හා ඊට අදාල පොලිය එම ස්ථාවර තැන්පතු කල්පිරෙන දිනයන්හිදී අයකර ගන්නා ලෙස සමුපකාර කොමසාරිස්ගේ 2011 අගෝස්තු 16 දිනැති අංක 2/අර02/සමු.අර/ස්.තැ/2011 දරන ලිපිය මඟින් අදාල බැංකුව වෙත දන්වා තිබුණි. ඒ අනුව, ඇප තබන ලද ස්ථාවර තැන්පතුවලින් රු.45,400,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී අදාල බැංකුව විසින් අයකරගෙන තිබුණු අතර, තවදුරටත් ගෙවිය යුතු ණය ශේෂය රු.44,600,000 ක් විය.

(iv) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවැති රු.129,788,343 ක් වූ ස්ථාවර තැන්පතුවලින් රු.89,111,265 ක් එනම් සියයට 68.66 ක් ඉහත ණය පියවීමට හා උත්සවයට අවශ්‍ය මුදල් වෙනුවෙන් වැය කර තිබුණි.

(ආ) 2003 ඔක්තෝබර් 01 දින සිට කාෂි අරමුදල වසා දැමීමට තීරණය කර තිබුණු අතර එකතුව රු.16,919,506 ක් වූ වත්කම් හා එකතුව රු.16,919,506 ක් වූ බැරකම් 2008 වර්ෂයේදී අරමුදලේ ගිණුම්වලට ගෙන තිබුණි. මෙම අරමුදල් දෙක පිහිටුවීමේ අරමුණු එකිනෙකට වෙනස් වන හෙයින් එම වත්කම් හා බැරකම්, අරමුදලට එකතු කිරීම, කුමන පදනමක් මත සිදු කලේද යන්න පිළිබඳව හා පවරා ගත් වත්කම් හා බැරකම්හි දැක්වෙන වටිනාකම්වල නිවැරදිතාවය විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

## 3.2 අරමුණු කරා ළඟා නොවීම

1972 අංක 5 දරන සමූපකාර පනතේ 61 වගන්තිය අනුව පනවන ලද රීති මාලාවේ 43 (i) රීතිය ප්‍රකාර, අරමුදලේ මුදල් යෙදවිය හැක්කේ සමුපකාර අධ්‍යාපනය, සමුපකාර සමිතිවලට උපකාර කිරීම වැනි අරමුණු සඳහා වුවද, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව 2007 වර්ෂයෙන් පසුව සමුපකාර සමිතිවලට ණය පහසුකම් ලබා නොදීම මෙන්ම සමුපකාර අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීම මගින් එම අරමුණුවලින් බැහැරව කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එම මූල්‍ය ප්‍රකාශන මාස 17 ක ප්‍රමාදයකින් පසුව 2013 ජූලි 31 දින ඉදිරිපත් කර තිබුණි.

## 4.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා තථ්‍ය අගයන් අතර විචලනයන් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 4.3 අභ්‍යන්තර විගණනය

අරමුදල වෙනුවෙන් සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් විගණන වැඩසටහනක් පිළියෙල කර තිබුණද, ඒ අනුව සිදු කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

------------------

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කොමසාරිස්වරයාගේ අවධානයට යොම කරන ලද. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය.

(ආ) වත්කම් පාලනය.

(ඇ) දායක මුදල් එකතු කිරීම.

(ඈ) ණය අයකර ගැනීම.

(ඉ) අයවැය පාලනය.

(ඊ) අත්තිකාරම්.

(උ) ආයෝජන.